මගේ අංකය 3/ පී එම් ඩී /එස් ඩී / එස් එස් / 43
ඉංග්‍රීසි පිළිබඳ සමායෝජන ඒකකය,
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය,
"ඉසුරුපාය" බත්තරමුල්ල.

1994 ජනවාරි මස 07 වන දින.

චක්‍රලේඛ අංක 94/4

සියලුම පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂවරුන් හා
සියලුම ජාතික පාසල් විදුහල්පතීන් වෙත.

## ජාතික පාසල්වල අ.පො.ස. (උ. පෙ.) පන්තිවල ඉංග්‍රීසි විෂය ඉගැන්වීම

සෑම ජාතික පාසලකම අ.පො.ස. (උසස් පෙළ) සඳහා ඉංග්‍රීසි විෂය ඉගැන්වීමට අවශ්‍ය පහසුකම් සැලැස්වීමට මෙම අමාත්‍යාංශය තීරණය කොට ඇත. ඒ අනුව ආරම්භක පියවරක් වශයෙන් තෝරාගත් සුදුසුකම් ඇති ගුරුවරුන් යොදා ගනිමින් එක් එක් පාසලට සුදුසු වන පරිදි පාසල් කාලය තුළ හෝ, පාසල් කාලයෙන් පසුව සවස් වරුවේ හෝ සති අන්තවල හෝ මෙම වැඩසටහන් ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කෙරේ. මෙම ක්‍රියාවලියේ අරමුණ ඉංග්‍රීසි ඉගැන්වීමේ හා ඉගෙනීමේ ගුණාත්මක වර්ධනයක් ඇති කරලීම ය. මීට අමතරව පුළුල් සාහිත්‍යයකට අවතීර්ණ වීමෙන් පූර්ණ මිනිසෙකු ලෙස දියුණු වීමත්, ඉංග්‍රීසි දැනුම ලැබූ අයගේ සංඛ්‍යාව වැඩි වීමත් මෙයින් බලාපොරොත්තු වේ.

2. මේ සඳහා දැනට සාමාන්‍ය ඉංග්‍රීසි උදෙසා වෙන්කොට ඇති කාලච්ඡේද ද උපයෝගී කොට ගෙන මසකට පැය විස්සක් නොඉක්මවන පරිදි එක් එක් පාසලට සුදුසුවන සේ පාසල් කාලය තුළ හෝ පසුව හෝ සති අන්තවල හෝ අවශ්‍ය පන්ති සංවිධානය කොට ගත යුතුය.

3. දැනට සාමාන්‍ය ඉංග්‍රීසි සඳහා වෙන් කොට ඇති කාලච්ඡේද බොහෝ පාසල්වල උපයෝගී කරගනු ලැබෙනුයේ විශේෂ විෂය ධාරා උදෙසාය. සාමාන්‍ය ඉංග්‍රීසි උගන්වන පාසල්වල පවා එම කාලච්ඡේදවලදී නියත පාඨමාලාවක් අනුගමනය කරනු නොලැබේ. එබැවින් අ.පො.ස (උ.පෙ.) ඉංග්‍රීසි විෂය මාලාවේ නිර්දිෂ්ට ග්‍රන්ථ හැර දෙවන ප්‍රශ්න පත්‍රයට අදාළ භාෂා කොටසින් මෙම විෂය ඉගැන්වීම ආරම්භ කළ හැකිය. එයින් තමා ඉදිරිපත් වන විභාගය පවත්වන වර්ෂයේ දී ම අ.පො.ස (උ.පෙ.) විෂය මාලාවේ භාෂාමය කොටස සම්පූර්ණ කර ගත හැකිය.

4. ජාතික පාසල්වල ඉංග්‍රීසි විෂයයක් වශයෙන් ඉගැන්වීමට අවස්ථාව සැලසීමෙන් ඒ ඒ විෂය ධාරා තෝරා ගන්නා ශිෂ්‍යයින්ට ඉංග්‍රීසි විෂය හැදෑරීම අනිවාර්ය කරනු ලැබේ.

5. මෙම පන්තිවලට සහභාගිවීම, දැනට ඉංග්‍රීසි විෂයයක් වශයෙන් හදාරන සිසුන්ට එම විෂයයෙන් සමාර්ථය ලැබීමට රුකුලක් වන අතර වෙනත් විෂය ධාරාවක් හදාරන සිසුන්ට තම විෂයට අදාළ පොත පත අධ්‍යයන කිරීමේදී, පසුව වෘත්තීය දියුණුවට අමතර උපකාරයක් ද වේ.

6. මෙම විෂය ඉගැන්වීමට සුදුසුකම් ඇති ගුරුවරුන්, ස්ථිර ගුරු මණ්ඩලයේ පාසල්වලට මෙම පාඨමාලා මෙහෙය වීම උදෙසා අවශ්‍ය ලෙස සුදුසුකම් ඇති විශ්‍රාමික ගුරුවරුන් නම් කර එවනවා ඇත.

විශ්‍රාමික උපදේශකයින්ගේ සේවා කොන්දේසි හා ගෙවීම් පිළිබඳ උපදෙස් ද යථා කාලයේ දී නිකුත් කෙරෙනු ඇත.

7. මෙම වැඩපිළිවෙල පළමුවන පාසල් වාරයේ ම ආරම්භ කිරීමට හැකිවන සේ අවශ්‍ය කටයුතු සංවිධානය කර ගන්නා මෙන් කරුණාවෙන් දන්වමි.

(අත්සන)
එන්. ඩී. කේ. කේ. වේරගොඩ
ලේකම්,
අධ්‍යාපන හා සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය.